# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,049 - 2017 දෙසැම්බර් මස 08 වැනි සිකුරාදා - 2017.12.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 2918 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2918 |


සැ. යු. -(i) ශ්‍රී නාථ අහස්ථාන ජාත්‍යන්තර බෞද්ධ භාවනා මධ්‍යස්ථාන කාර්ය සාධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 නොවැම්බර් මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) මෝහන් ලංකා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 නොවැම්බර් මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 දෙසැම්බර් මස 29 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 දෙසැම්බර් මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2915 - B 81232 — 5,403 (2017/12)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබූවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්ලටින් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය

### නිවේදනයයි

බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයෙහි විධායක ශ්‍රේණියේ නීති නිලධාරි තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීමට අදළ නිවේදනය 2017.04.12 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* I කොටස (IIඅ) ඡේදය යටතේ නිවේදන අංක 04-503 හි පළ කරන ලදී.

එනමුදු, එකී බඳවා ගැනීමට අදළ එම නිවේදනය තාවකාලිකව අත්හිටවූ බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ලේකම්, *(වැ. බ.)*
බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා
හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය.

12-73

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය

### සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පශු සම්පත් සංවර්ධන නිලධාරි තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීම - 2018

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ, පශු සම්පත් සංවර්ධන නිලධාරි තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. *විභාගය :*
2018 පෙබරවාරි මාසයේ දී සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් මහනුවර දී මෙම විභාගය පවත්වනු ලැබේ. මෙම විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීමට සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

03. *සේවා කොන්දේසි :*
රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද මෙහි පහත සඳහන් කොන්දේසි වලට ද යටත්ව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පශු සම්පත් සංවර්ධන නිලධාරි තනතුරේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

(I) පත්කරනු ලබන නිලධාරියා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත් වේ.

(II) මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දයක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දයක මුදල් ගෙවිය යුතුය.

(III) බඳවාගනු ලබන නිලධාරීන් වසර 03 ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරන ලද නිලධාරියෙකු පත් කරනු ලැබුවහොත්, එක් වසරක වැඩ බැලීමේ කාලසීමාවකට යටත් කරනු ලැබේ. විවෘත බඳවා ගැනීම් තුළින් පත් කරනු ලබන නිලධාරීන් තනතුරේ ස්ථිර කිරීමට පෙරාතුව, නියමිත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්ව තිබීම ද අවශ්‍ය වේ.

(IV) රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියළුම නිලධාරීන් සේවයට බැඳුනු රාජ්‍ය භාෂාවකට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබාගත යුතුය.

(V) පත්වීම් ලබන නිලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලට ද, කාර්ය පරිපාටික රීති වලට ද, ආයතන සංග්‍රහයේ විධි විධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසිවලටත් අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ රෙගුලාසිවලටත් යටත් වේ.

04. *වැටුප් පරිමාණය :*
MN - 3 - 2016 - ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පශු සම්පත් සංවර්ධන නිලධාරි තනතුරේ III ශ්‍රේණියේ රු. 31,040 - 10x445 - 11x660 - 10x730 - 10x750-රු. 57,550
(රා.පරි.ච.ලේ 03/2016 අනුව මාසික)

මෙම වැටුප් පරිමාණයේ රු. 31,040 -18x445 - රු. 39,050 වැටුප් පියවරයන් මෙම ශ්‍රේණියට හිමි වේ.

III ශ්‍රේණියේ නිලධාරින් තුන්වන වැටුප් වර්ධකය ලැබීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

05. *වයස් සීමාව* :

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

06. *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්* :

*අධ්‍යාපන සුදුසුකම්* :

රසායන විද්‍යාව, කෘෂිකර්ම විද්‍යාව හා ජීව විද්‍යාව යන විෂයයන් අතරින් විෂයයන් දෙකක් සහිතව විද්‍යා/ ගණිත විෂය ධාරාවන්ට අයත් විෂයයන් තුනකින් අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර සමත්වීම;

*සහ*

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පෙදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

*වෘත්තීය සුදුසුකම්* :

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑවුරුදු සත්ත්ව පාලන ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම;

*හෝ*

සත්ත්ව පාලන ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;

*හෝ*

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

*සටහන* :

ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර පූර්ව සුදුසුකම් ලබාගෙන තිබිය යුතුය. ප්‍රතිඵල අපේක්ෂාවෙන් ඉදිරිපත්වන ඉල්ලුම්පත් වලංගු නොවේ.

*කායික සුදුසුකම්* :

මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු අතර, මනා ශරීර සෞඛ්‍ය තත්ත්වය වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මගින් සනාථ විය යුතුය.

*වෙනත්* :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිලිගනු ලබන්නේ, අයදුම්කරු අදළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

07. *බඳවා ගැනීමේ ක්‍රමය* :

ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

*ලිඛිත විභාගය* :

මෙම විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

| විෂයයන් | කාලය | උපරිම ලකුණු පරිමාණය | සමත් ලකුණු පරිමාණය |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 2. පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) | පැය 01 | 100 | 40 |

08. *විභාගය* :-

(I) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.
(II) අපේක්ෂකයින් කැමති භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක.
(III) ඉල්ලීම කරන ලද භාෂා මාධ්‍යය විභාගයේ දී වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.
(IV) විභාග ගාස්තුව රු. 400 කි.
(V) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට නිකුත් කරන ලද පේරාදෙණිය, තැපැල් කාර්යාලයෙන් මුදල් කර ගත හැකි වනසේ ලබාගත් මුදල් ඇණවුමක් ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය.

(VI) විෂය නිර්දේශය :

*(අ)* බුද්ධි පරීක්ෂණය :-

අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත් ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත් තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

*(ආ)* පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය)

(I) ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික හා සත්ත්ව පාලන කටයුතු පිළිබඳ පවත්නා සම්පත්, විභවයන් වර්තමාන තත්ත්වයන් හා ආර්ථිකයට ඇති දයකත්වය

(II) ශ්‍රී ලංකාවේ සත්ත්ව නිෂ්පාදන රටා, නිෂ්පාදන ප්‍රමාණයන් හා අලෙවිකරණ ක්‍රම ශ්‍රී ලංකාවේ පවතින සත්ත්ව පාලන ගොවිපල රටා ඒවායේ පිහිටීම හා විසිරීම.

(III) ගොවිපල සතුන් අභිජනනය සඳහා බහුලව යොදගන්නා ක්‍රම

(IV) බෝවෙන සත්ත්ව රෝග, සත්ත්ව රෝග මර්දන ක්‍රියා පිලිවෙත් රෝගී සතුන්ගේ නියැදි රැස්කිරීම හා ප්‍රවාහනය

(V) ඒකාබද්ධ ගොවිපල් ක්‍රම හා ප්‍රතිචක්‍රිය කරණ ක්‍රම

(VI) සත්ව පාලනය හා ආශ්‍රිතව කර්මාන්ත කිරි සැකසීම, මස් සැකසීම, සත්ත්ව ආහාර නිෂ්පාදනය

(VII) සත්ත්ව නිෂ්පාදන ක්‍රියාවලියට අදළ ආදයම් වියදම් ගණනය ක්‍රම, ගොවිපල් වාර්තා කරණය හා ගිණුම් විශ්ලේෂණය, සත්ත්ව ගොවිපල් සැලසුම් කරණය

(VIII) විද්‍යාත්මක තොරතුරු ප්‍රචාරණ ක්‍රම භාවිතය හා ඒවායේ ඵලදයිතාවයන්

09. *ඉල්ලුම්කිරීමේ ක්‍රමය* :

(1) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනය සමග ඇති ආදර්ශ ආකෘතියට අනුකූලවිය යුතුය. 8 1/2x12 (A4) ප්‍රමාණයේ කඩදසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කරගත් ඉල්ලුම්පත්‍රය 2017.12.31 වැනි දිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ.පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "පශු සම්පත් සංවර්ධන නිලධාරි තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සටහන* :

(I) රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය ඉල්ලුම්පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

(II) සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී ඉල්ලුම්පත්‍ර නැතිවීම හෝ ප්‍රමාදවීම සම්බන්ධව කෙරෙන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(III) ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. විභාගය පැවැත්වෙන දිනය පුවත්පත් දැන්වීමක් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ. ඉල්ලුම්කරුවන්ට විභාග ප්‍රවේශපත්‍රය විභාගය පැවැත්වෙන දිනයට දින හතරකට කලින් නොලැබුනහොත් පහත සඳහන් විස්තර ඇතිව වහාම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට දැන්විය යුතුය.

I අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :

II ලිපිනය :

III ඉල්ලුම්පත් තැපැල් කිරීමේ දිනය, ලියාපදිංචි අංකය, තැපැල් කාර්යාලය

10. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය.

I උප්පැන්න සහතිකය

II අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් තහවුරු කිරීමේ සහතික

*අපේක්ෂකයාගේ අනන්‍යතාවය* :-

විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාග ශාලාවේ දී තමාගේ අනන්‍යතාවය විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් ඔප්පුකර සිටිය යුතුය. ඒ සඳහා පහත ලේඛන පිළිගැනේ.

I පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය

II වලංගු විදේශ ගමන් බලපත්‍රය

*සාවද්‍ය තොරතුරු සැපයීම* :-

මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා යම් අපේක්ෂයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ, විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හැකි වන්නේය. අපේක්ෂකයකු ඉදිරිපත් කල කිසියම් තොරතුරක් සාවද්‍ය බව දන දන ඉදිරිපත් කල බව පෙනී ගිය හොත් ඔහු සේවයෙන් පහ කිරීමට යටත් වන්නේය.

මෙම *ගැසට් පත්‍රයේ* 03 ඡේදයේ ප්‍රකාශිත රාජ්‍ය සේවයට පත් කිරීමට අදළ වන පොදු කොන්දේසි කෙරෙහි හා විභාග අපේක්ෂකයින් සඳහා නීති හා උපදෙස් කෙරෙහි අවධානය යොමුකර ඒවා පිළිපැදිය යුතුය.

11. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් පරස්පරතාවයන් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

12. මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටළුවක් මතුවුවහොත් ඒ සම්බන්ධයෙන් ද විභාගය මගින් බඳවා ගතයුතු අපේක්ෂක සංඛ්‍යාව සම්බන්ධයෙන්ද, තීරණයක් ගැනීමේ බලය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සතුවේ. එය අවසන් තීරණය වේ.

වෛද්‍ය ආර්. එම්. ආරියදාස,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

2017 නොවැම්බර් මස 15 වැනි දින,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

**ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය**
**සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ**
**පශු සම්පත් සංවර්ධන නිලධාරී තනතුර සඳහා අයදුම්පත**

| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය | |
|---|---|

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

අදාළ අංකය කොටුව තුළ ලියන්න
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

01. නම :
1.1 මුලකුරු අගට යොද මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
.................................................. (*උද* :) SILVA B.A.
1.2 සම්පූර්ණ නම සිංහලෙන් :————.
1.3 ජාතික හැඳුනුම්පත් අංකය :

02. i ලිපිනය :————.
පෞද්ගලික :————.
රාජකාරී :————.
ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය :————.
ii සම්බන්ධකර ගත හැකි දුරකථන අංක :
ජංගම :————. ස්ථාවර :————.

03. 3.1 ස්ත්‍රී පුරුෂ භාවය (අදාළ කොටුව තුළ සලකුණු කරන්න)
ස්ත්‍රී
පුරුෂ

3.2 උපන් දිනය :-
වර්ෂය : මාසය : දිනය

3.3 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට වයස :
අවුරුදු : මාස : දින :

3.4 විවාහක අවිවාහක බව (අදාළ අංකය කොටුව තුළ සලකුණු කරන්න)
විවාහක
අවිවාහක

04. අධ්‍යාපන සුදුසුකම් :-
4.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය
වර්ෂය :————. මාසය :————.

| විෂය | ලබාගත් සාමාර්ථය | විභාග අංකය |
|---|---|---|
| | | |

4.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය
වර්ෂය :————. මාසය :————.

| විෂය | ලබාගත් සාමාර්ථය | විභාග අංකය |
|---|---|---|
| | | |

4.3 (*අ*) වෘත්තීය සුදුසුකම් ලබාගත් ආයතනය :————.
(*ආ*) වෘත්තීය සුදුසුකම් ලබාගත් වර්ෂය :————.

05. වර්තමාන රැකියාව හා කලින් දැරූ පත්වීම් (ඇත්නම් පමණක්)

| *තනතුර* | *ආයතනය* | *සිට* | *දක්වා* |
|---|---|---|---|
| | | | |

06. විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලයේ නම :————.
මුදල් ඇනවුම් අංකය :————.

සම්පූර්ණ විභාග ගාස්තුව රු. 400 කි. දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකින් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට ගෙවන කාර්යාලය :- පේරාදෙණිය කුවිතාන්සිය මෙහි අලවන්න.

07. මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුසුසකු බවට පවත්වන බවටත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

දැනට රජයේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරීන්ට පමණක් අදාළ වේ.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

මෙම දෙපාර්තමේන්තුවේ ................................................................ .................................. ලෙස සේවය කරන .................................. මයා/මිය/මෙනවිය විසින් සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත් ඒවා නිවැරදි බවත් අපේක්ෂකයා/ අපේක්ෂිකාව ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා.
(නිල මුද්‍රාව තැබිය යුතුය)

පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

12 - 07

---

**ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය**

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ පර්යේෂණ සහකාර තනතුරට බඳවා ගැනීම - 2018**

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ පර්යේෂණ සහකාර තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. *විභාගය* :-
2018 පෙබරවාරි මාසයේදී සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් මහනුවරදී මෙම විභාගය පවත්වනු ලැබේ. මෙම විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීමට සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

03. *සේවා කොන්දේසි* :-
රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, මෙහි පහත සඳහන් කොන්දේසි වලට ද, යටත්ව පර්යේෂණ සහකාර තනතුරේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

(I) පත්කරනු ලබන නිලධාරියා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත් වේ.

(II) මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින්විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(III) බඳවාගනු ලබන නිලධාරීන් වසර 03 ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරන ලද නිලධාරියෙකු පත් කරනු ලැබුවහොත්, එක් වසරක වැඩ බැලීමේ කාලසීමාවකට යටත් කරනු ලැබේ. විවෘත බඳවා ගැනීම් තුළින් පත් කරනු ලබන නිලධාරීන් තනතුරේ ස්ථිර කිරීමට පෙරාතුව, නියමිත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්ව තිබීම ද අවශ්‍ය වේ.

(IV) රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුනු රාජ්‍ය භාෂාවකට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතාවයක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබාගත යුතුය.

(V) පත්වීම් ලබන නිලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලට ද, කාර්ය පරිපාටික රීති වලට ද, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසිවලටත් අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ රෙගුලාසි වලටත් යටත් වේ.

04. *වැටුප් පරිමාණය* :-
MN - 3 - 2016 - ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පර්යේෂණ සහකාර තනතුරේ III ශ්‍රේණියේ රු. 31,040 - 10x445 - 11x660 - 10x730 - 10x750-රු. 57,550
(රා.පරි.ච.ලේ 03/2016 අනුව මාසික)
මෙම වැටුප් පරිමාණයේ රු. 31,040 -18x445 - රු. 39,050 වැටුප් පියවරයන් මෙම ශ්‍රේණියට හිමි වේ. III ශ්‍රේණියේ නිලධාරීන් තුන්වන වැටුප් වර්ධකය ලැබීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

05. *වයස් සීමාව* :-

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවු. 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

06. *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්* :
අධ්‍යාපන සුදුසුකම් :
රසායන විද්‍යාව, කෘෂිකර්ම විද්‍යාව හා ජීව විද්‍යාව යන විෂයයන් අතරින් විෂයයන් දෙකක් සහිතව විද්‍යා/ ගණිත විෂය ධාරාවන්ට අයත් විෂයයන් තුනකින් අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර සමත්වීම.

සහ

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

*වෘත්තීය සුදුසුකම් :*

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑවුරුදු සත්ත්ව පාලන ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම;

*හෝ*

සත්ත්ව පාලන ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;

*හෝ*

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

*සටහන :*

ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර පූර්ව සුදුසුකම් ලබාගෙන තිබිය යුතුය. ප්‍රතිඵල අපේක්ෂාවෙන් ඉදිරිපත් කරන ඉල්ලුම්පත් වලංගු නොවේ.

*කායික සුදුසුකම් :-*

මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් හා විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු අතර, මනා ශරීර සෞඛ්‍ය තත්වය වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මගින් සනාථ විය යුතුය.

*වෙනත් :*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ, අයදුම්කරු අදළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

07. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

*ලිඛිත විභාගය :-*

මෙම විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු පරිමාණය* | *සමත් ලකුණු පරිමාණය* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 2. පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) | පැය 01 | 100 | 40 |

08. *විභාගය :*

(I) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.
(II) අපේක්ෂකයින් කැමති භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක.
(III) ඉල්ලීම කරන ලද භාෂා මාධ්‍යය විභාගයේ දී වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.
(IV) විභාග ගාස්තුව රු. 400 කි.
(V) සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට නිකුත් කරන ලද පේරාදෙණිය, තැපැල් කාර්යාලයෙන් මුදල් කර ගත හැකි වනසේ ලබාගත් මුදල් ඇණවුමක් ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය.
(VI) විෂය නිර්දේශය :
  (අ) <u>බුද්ධි පරීක්ෂණය</u> :
  අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත් ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත් තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත ය.
  (ආ) <u>පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය)</u> :
  (I) රසායනාගාර උපකරණ හඳුනාගැනීම හා නඩත්තුව,
  (II) රෝග විනිශ්චය සඳහා යොදා ගන්නා පරීක්ෂණ ක්‍රම,
  (ව්‍යාධි වේද, පරපෝෂිත වේද, ක්ෂුද්‍ර ජීව වේද, මස්තු වේද, පෝෂණ)
  (III) තත්ත්ව පාලනය සඳහා යොදා ගන්නා පරීක්ෂණ ක්‍රම,
  (භෞතික පරීක්ෂණ, රසායනික පරීක්ෂණ, සංවේදතා පරීක්ෂණ)
  (IV) රසායනාගාර පවිත්‍රතාව, විෂබීජහරණය,
  (V) සාම්පල් ලබාගැනීම, ගබඩා කිරීම, ප්‍රවාහනය.

09. *ඉල්ලුම්කිරීමේ ක්‍රමය :*

(1) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනය සමග ඇති ආදර්ශ ආකෘතියට අනුකූලවිය යුතුය. 8 1/2"x12" (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කරගත් ඉල්ලුම්පත්‍රය **2017.12.31** වැනි දිනට පෙර ''අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන

හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ.පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය'' යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "පර්යේෂණ සහකාර තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය" යනුවෙන් පැහැදිලිව සටහන් කල යුතුය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සටහන* :

(I) රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය ඉල්ලුම්පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

(II) සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී ඉල්ලුම්පත්‍ර නැතිවීම හෝ ප්‍රමාදවීම සම්බන්ධව කෙරෙන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(III) ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. විභාගය පැවැත්වෙන දිනය පුවත්පත් දැන්වීමක් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ. ඉල්ලුම්කරුවන්ට විභාග ප්‍රවේශපත්‍රය විභාගය පැවැත්වෙන දිනයට දින හතරකට කලින් නොලැබුනහොත් පහත සඳහන් විස්තර ඇතිව වහාම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට දැන්විය යුතුය.

I අපේක්ෂකයන්ගේ සම්පූර්ණ නම :
II ලිපිනය :
III ඉල්ලුම්පත් තැපැල් කිරීමේ දිනය, ලියාපදිංචි අංකය,තැපැල් කාර්යාලය :

10. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය.

I උප්පැන්න සහතිකය,
II අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් තහවුරු කිරීමේ සහතික,

*අපේක්ෂකයාගේ අනන්‍යතාවය* :
විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාග ශාලාවේදී තමාගේ අනන්‍යතාවය විභාගශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් ඔප්පුකර සිටිය යුතුය. ඒ සඳහා පහත ලේඛන පිළිගැනේ.

I පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය,
II වලංගු විදේශ ගමන් බලපත්‍රය.
(විභාග දිනට අවුරුදු 3කට කලින් නිකුත් කරන ලද)

*සාවද්‍ය තොරතුරු සැපයීම* :

මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා යම් අපේක්ෂයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ, විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හැකි වන්නේය. අපේක්ෂකයකු ඉදිරිපත් කල කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන දැන ඉදිරිපත් කල බව පෙනී ගිය හොත් ඔහු සේවයෙන් පහ කිරීමට යටත් වන්නේ ය.

මෙම *ගැසට්* පත්‍රයේ 03 ඡේදයේ ප්‍රකාශිත රාජ්‍ය සේවයට පත් කිරීමට අදාල වන පොදු කොන්දේසි කෙරෙහි හා විභාග අපේක්ෂකයින් සඳහා නීති හා උපදෙස් කෙරෙහි අවධානය යොමු කර ඒවා පිළිපැදිය යුතුය.

11. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් පරස්පරතාවයන් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

12. මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටළුවක් මතුවුවහොත්, ඒ සම්බන්ධයෙන් ද විභාගය මගින් බඳවා ගතයුතු අපේක්ෂක සංඛ්‍යාව සම්බන්ධයෙන්ද, තීරණයක් ගැනීමේ බලය සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සතුවේ. එය අවසන් තීරණය වේ.

වෛද්‍ය ආර්.එම්. ආරියදස,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

2017 නොවැම්බර් මස 15 වැනි දින,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
පේරාදෙණිය.

## ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය

### සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
### ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ
### පර්යේෂණ සහකාර නිලධාරි තනතුර සඳහා අයදුම්පත

| | |
|---|---|
| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය | |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(අදල අංකය කොටුව තුල ලියන්න)

01. නම :-
1.1 මුලකුරු අගට යොදු මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
.................................................. (උදා :) SILVA B.A.
1.2 සම්පූර්ණ නම සිංහලෙන් :————.
1.3 ජාතික හැඳුනුම්පත් අංකය :

02. 2.1 ලිපිනය :
පෞද්ගලික :————.
රාජකාරී ලිපිනය :————.
ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.

03. ස්ත්‍රී පුරුෂ භාවය (අදල කොටුව තුළ සලකුණු කරන්න)

3.1 ස්ත්‍රී
පුරුෂ

3.2 උපන් දිනය :

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.3 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස :

අවුරුදු ☐☐☐☐ මාස ☐☐ දින ☐☐

3.4 විවාහක අවිවාහක බව (අදාල අංකය කොටුව තුළ සලකුණු කරන්න) :

විවාහක ☐
අවිවාහක ☐

04. අධ්‍යාපන සුදුසුකම් :-

4.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය :
වර්ෂය :————. මාසය :————.

| විෂය | ලබාගත් සාමාර්ථය | විභාග අංකය |
|---|---|---|
| | | |

4.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය:
වර්ෂය :————. මාසය :————.

| විෂය | ලබාගත් සාමාර්ථය | විභාග අංකය |
|---|---|---|
| | | |

4.3 (අ) වෘත්තීය සුදුසුකම් ලබාගත් ආයතනය :————.

4.3 (ආ) වෘත්තීය සුදුසුකම් ලබාගත් වර්ෂය :————.

05. වර්තමාන රැකියාව හා කලින් දැරූ පත්වීම් (ඇත්නම් පමණක්)

| තනතුර | ආයතනය | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

06. විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලයේ නම :————.
මුදල් ඇනවුම් අංකය :————.

> සම්පූර්ණ විභාග ගාස්තුව රු. 400 කි. දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකින් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට ගෙවන කාර්යාලය :- පේරාදෙණිය
> කුවිතාන්සිය මෙහි අලවන්න.

07. මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවටත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

දැනට රජයේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරීන්ට පමණක් අදාල වේ.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

මෙම දෙපාර්තමේන්තුවේ ................................................................ ලෙස සේවය කරන .................................. මයා/මිය/මෙනවිය විසින් සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත් ඒවා නිවැරදි බවත් අපේක්ෂකයා/අපේක්ෂිකාව ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා
(නිල මුද්‍රාව තැබිය යුතුය)

පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

12 - 08

---

**ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය**

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ කාර්මික නිලධාරී (සිවිල්) තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017**

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්) තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. ඒ අනුව, වයස සම්බන්ධ සුදුසුකම සපුරාලනුයේ අයදුම්කරුවන්ගේ උපන් දිනය 2000.01.08 දින හෝ ඊට පෙර හා 1988.01.08 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.

03. මෙම තනතුර සඳහා 2020.01.01 දිනට MN 3- 2016 අනුව රු. 31,040-10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 57,550 මාසික වැටුප් පරිමාණයක් හිමිවේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව වැටුප් ගෙවීමට කටයුතු කරනු ලැබේ.

04. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයකට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

05. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට අයදුම්කරුවන් පහත සඳහන් සියලුම මූලික අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අත්‍යවශ්‍ය වේ.;

අධ්‍යාපන සුදුසුකම් :-

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

*සහ*

සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සිවිල් තාක්ෂණවේදය, ඉංජිනේරු තාක්ෂණවේදය සහ තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයන් (02) දෙකක් සහිතව විෂයන් (03) තුනකින් අ.පො.ස. (උ/පෙළ) විභාගය එකවර සමත්වීම.

වෘත්තීය සුදුසුකම් :

i. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

ii. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව;

*හෝ*

iii. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව;

*හෝ*

iv. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

v. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම.

*හෝ*

vi. රැකියා ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;

හෝ

vii. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

06. *අයදුම් කළයුතු ක්‍රමය* :

(*අ*) මෙම නිවේදනයේ අවසානයේ පළකර ඇති ආදර්ශ ආකෘතිය අනුව ඒ 4 (21cm x 29cm) ප්‍රමාණයේ කඩදසියක දෙපැත්ත භාවිතා කරමින් අංක 1 සිට 7 දක්වා ඡේද මුල් පිටුවට ද අනෙකුත් ඡේද පිළිවෙලින් අනෙක් පිටුවලට ද ඇතුලත් වන පරිදි අයදුම්පත් පිළියෙල කළ යුතු අතර ඊට අදළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුලත් කළ යුතුය. අයදුම්පත සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙනි.

(*ආ*) අයදුම්පත්‍ර පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

(*ඇ*) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2018.01.08 දින හෝ ඊට ප්‍රථම 'අධ්‍යක්ෂ ජනරාල්'', අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1095, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, පේරාදෙණිය'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ'' අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ කාර්මික නිලධාරී (සිවිල්) තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017'' ලෙස පැහැදිලිව සඳහන් කළ යුතුය.

(*ඈ*) ලංකා බැංකුවේ පේරාදෙණිය ශාඛාවේ අංක 7042612 දරන ගිණුමට බැර වන ලෙස විභාග ගාස්තු වශයෙන් රු. 500 ක් දිවයිනේ ඕනෑම බැංකු ශාඛාවකට ගෙවා යන්ත්‍ර මුද්‍රාව සහිත මුදල් බැඳීමේ කුවිතාන්සියේ පිටපත අයදුම්පතේ නියමිත ස්ථානයේ අලවා එවිය යුතුය. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(*ඉ*) මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර, සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, තැපෑලේදී සිදුවන නැතිවීම හා ප්‍රමාදවීම් පිළිබඳ දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ. අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ඊ) අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවාද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී ලත් නිලධාරියෙකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු ලවා සහතික කරවා ගත යුතුය.

(උ) දැනටමත් රජයේ සේවයේ නියුතුවූවන් තම ආයතන ප්‍රධානියා මගින් මෙම අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

07. *විභාග පරිපාටිය :-*

(අ) මෙම විභාගය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබේ.

(ආ) නිවේදනයේ සඳහන් වයස් සීමා තුළවන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයෙකු තමාට නියමිත මධ්‍යස්ථානයේ දී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශපත්‍රය ඉදිරිපත් නොකරන කිසිදු අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ඇ) විභාගයට පෙනී සිටීම වෙනුවෙන් අපේක්ෂක අපේක්ෂිකාවන්ට දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

(ඈ) (i) *අනන්‍යතාවය* :- තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කළ යුතුය. මේ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පිළිගැනේ.

(ii) තම අනන්‍යතාවය තහවුරු කිරීමට අදාළ ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

(ඉ) විෂය නිර්දේශය :

| විෂයය අංකය | විෂයය | කාලය පැය | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | 1 | 100 | 40% |
| 02 | පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පොදු පරීක්ෂණය) | 3 | 100 | 40% |

(i) බුද්ධි පරීක්ෂණය :-
අපේක්ෂකයාගේ, තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව සිතීමේ හැකියාවත් තීරණ ගැනීමේ ශක්තියත් නිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

(ii) පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පොදු පරීක්ෂණය) :-

- ➢ මැනීම හා මට්ටම් ගැනීම පිළිබඳ දැනුම
- ➢ ගොඩනැගිලි ද්‍රව්‍ය යොදා ගනු ලබන ආකාරයට හා ප්‍රමිතිය පිළිබඳ දැනුම
- ➢ අත්තිවාරම්, බිත්ති බැඳීම, දැව වහලය, යකඩ තාප්ප, කුළුණු කොන්ක්‍රීට් තලාද සහ කොන්ක්‍රීට් කුළුණු, අත්තිවාරම් තට්ටු තරප්පු ආදිය යොදනු ලබන ආකාරය හා යොදනු ලබන අවස්ථා
- ➢ ගොඩනැගිලි ඉදිකිරීම හා ඇස්තමේන්තු පිළියෙල කිරීම
- ➢ අදල ඇස්තමේන්තු හා ඉදිකිරීම සඳහා අවශ්‍ය වන ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රමාණයන් හා කම්කරු ශ්‍රමය ඇස්තමේන්තු කිරීම,
- ➢ ව්‍යුහ නම්‍යතා/ව්‍යාකෘති බල සටහන,
- ➢ විදුලි, ජල, සනීපාරක්ෂක සේවා පිළිබඳ දැනුම

(ඊ) මෙම විභාගය, සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර, විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් අදළ සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතුය.

08. සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :

(i) මෙම තනතුරු පුරප්පාඩුව පවතිනුයේ ගැටඹේ පිහිටි ප්‍රධාන කාර්යාලයේ වුවද තෝරාගනු ලබන අපේක්ෂක/අපේක්ෂිකාව දිවයිනේ සියළුම උප කාර්යාල ආවරණය වන පරිදි සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

(ii) මෙම තනතුරට පත් කරනු ලබන්නේ අවුරුදු 03 ක පරිවාස සේවා කාලයකට යටත් වනු ඇත.

09. බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත තරග විභාගය සඳහා නියමිත සෑම ප්‍රශ්න පත්‍රයකටම 40% ක් හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබා ගත් අපේක්ෂකයන්ගේ මුළු ලකුණුවල කුසලතාවයන් අනු පිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාවට සිව් ගුණයකට සමාන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු

දීම සිදු නොකරන අතර, සුදුසුකම් තහවුරු කළ අයදුම්කරුවන් විභාගයේ දී ලබා ගත් මුළු ලකුණුවල කුසලතා අනු පිළිවෙල මත බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

10. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුරට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට්* නිවේදනය අනුව සුදුසුකම් පරීක්ෂා කරන අවස්ථාවේ දී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් පත්වීම් ලැබීමට නුසුදුස්සකු සේ සලකා ක්‍රියා කරනු ලැබේ.

11. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධයෙන් පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

12. *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි, යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

13. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

ආචාර්ය ඒ. පී. හීන්කෙන්ද,
අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් (රා. ආ.)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

ආදර්ශ අයදුම්පත්‍රය

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ III ශ්‍රේණියේ කාර්මික නිලධාරී (සිවිල්) තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017**

Application for the competitive Examination for Recruitment to the post of Technical Officer (Civil) of Class III of the Sri Lanka Technological Service in the Department of Export Agriculture - 2017

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : සිංහල -2, දෙමළ -3, ඉංග්‍රීසි -4 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. නම :

1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : GUNAWARDHANA H. M. S. K. )

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.1 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 දුරකථන අංකය (ඇත්නම්) :

ජංගම

ස්ථාවර

03. ජාතික හැඳුනුම්පත් අංකය :

04. ස්ත්‍රී/පුරුෂ භාවය :

ස්ත්‍රී 1 පුරුෂ 0

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. විවාහක/අවිවාහක බව
විවාහක - 2 අවිවාහක -1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

06. 6.1 උපන් දිනය :-

වර්ෂය : මාසය : දිනය :

6.2 ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට (2018.01.08) වයස :

අවු. : මාස : දින :

07. අධ්‍යාපන සුදුසුකම් :
(අ) අ.පො.ස. (සා. පෙළ)
වර්ෂය හා මාසය :————.
විභාග අංකය :————.
භාෂා මාධ්‍යය :————.

| | විෂයය | සාමාර්ථය | | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 1. | | | 6. | | |
| 2. | | | 7. | | |
| 3. | | | 8. | | |
| 4. | | | 9. | | |
| 5. | | | 10. | | |

(ආ) අ.පො.ස. (උ. පෙළ) ඃ
වර්ෂය හා මාසය :————.
විභාග අංකය :————.
භාෂා මාධ්‍යය :————.

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 1. | | |
| 2 | | |
| 3. | | |
| 4. | | |

(ඇ) වෘත්තීය සුදුසුකම් ඃ- (ඩිප්ලෝමා සුදුසුකම්)
1. හදාරන ලද පාඨමාලාව :————.
2. පාඨමාලාව හැදෑරූ ආයතනයේ නම :————.
3. සමත් වූ වර්ෂය :————.
4. ඩිප්ලෝමාව වලංගු වන දිනය :————.

08. | විභාග ගාස්තු ගෙවනු ලැබූ කුවිතාන්සියේ අංකය | |

| |
|---|
| විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ එක් දරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.<br><br>(කුවිතාන්සියේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |

09. අයදුම්කරුගේ සහතිකය ඃ

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා බවට මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි ඒවා බව හෝ මා තෝරා ගැනීමට පෙර දැනගතහොත්, මා නුසුදුස්සකු වීමට යටත් වන බවත්, පත් කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දැන සිටිමි.

තව ද මෙම විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ...................... යන අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී. ........... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

11. අයදුම්කරු රජයේ සේවයේ නියුක්තවූවෙක් නම් ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ

ඉහත තොරතුරු සඳහන්.............. මයා/මිය/මෙනවිය ....................අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ කාර්යාලයේ සේවය කරන බවද ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බව ද නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බව ද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බව ද, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බව ද සහතික කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාව)

12-291

---

**ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය**

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ ගොවිපල් කළමනාකරු, ව්‍යාප්ති නිලධාරී හා තාක්ෂණික නිලධාරී තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017 (2018)**

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු අංකය* | *තනතුරු නාමය* |
|---|---|
| 01 | ගොවිපල් කළමනාකරු |
| 02 | ව්‍යාප්ති නිලධාරී |
| 03 | තාක්ෂණික නිලධාරී |

02. අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. ඒ අනුව, වයස සම්බන්ධ සුදුසුකම සපුරාලනුයේ අයදුම්කරුවන්ගේ උපන් දිනය 2000.01.08 දින හෝ ඊට පෙර හා 1988.01.08 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.

03. මෙම තනතුර සඳහා 2020.01.01 දිනට MN – 3 2016 අනුව රු. 31,040 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු.57,550 මාසික වැටුප් පරිමාණයක් හිමිවේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03 / 2016 අනුව වැටුප් ගෙවීමට කටයුතු කරනු ලැබේ.

04. මෙම තනතුර විශ්‍රම වැටුප් සහිතය. මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද , ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයකට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයකට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

05. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට අයදුම්කරුවන් පහත සඳහන් සියලුම මූලික අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අත්‍යාවශ්‍ය වේ.

*අධ්‍යාපන සුදුසුකම් :*

සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වීම.

*සහ*

ජීව විද්‍යාව, කෘෂිකර්මය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව , කෘෂි තාක්ෂණවේදය, ජෛව තාක්ෂණවේදය සහ තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයයන් (02) දෙකක් සහිතව විෂයයන් (03) තුන කින් අ.පො.ස. (උ/පෙළ) විභාගය එකවර සමත් වීම.

*වෘත්තීය සුදුසුකම් :*

**කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාලව පහත සඳහන් එක් ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම. :-**

(i) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාව,

(ii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාල උසස් ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව,

(iii) අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාල ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව,

(iv) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාල ඩිප්ලෝමාව,

(v) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාල ඩිප්ලෝමාව,

(vi) කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම,

(vii) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පිරිනමනු ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාව,

(viii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

06. *අයදුම් කළ යුතු ක්‍රමය :-*

(*අ*) මෙම නිවේදනයේ අවසානයේ පළකර ඇති ආදර්ශ ආකෘතිය අනුව ඒ 4 (21cm x 29cm) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් අංක 1 සිට 7 දක්වා ඡේද මුල් පිටුවට ද අනෙකුත් ඡේද පිළිවෙලින් අනෙක් පිටුවලට ද ඇතුළත් වන පරිදි අයදුම්පත් පිළියෙල කළ යුතු අතර ඊට අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. අයදුම්පත සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.

(*ආ*) එක් අයදුම්කරුවෙකුට එක් තනතුරක් හෝ තනතුරු කිහිපයක් සඳහා අයදුම් කළ හැකි අතර ඒ සඳහා වෙන් වෙන්ව අයදුම්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්වල පැහැදිලිව තනතුරු සඳහා ඉල්ලුම් කරන ප්‍රමුඛතාවය පහත සඳහන් සංකේත අංක සහිතව සටහන් කළ යුතුය. එසේම අයදුම්කරනු ලැබූ තනතුරු මනාප අනුපිළිවෙල පසුව වෙනස් කිරීමේ හැකියාවක් නොමැත.

| *අනු. අංකය* | *තනතුර* | *සංකේත අංකය* |
|---|---|---|
| 1 | ගොවිපල් කළමනාකරු | 001 |
| 2 | ව්‍යාප්ති නිලධාරි | 002 |
| 3 | තාක්ෂණ නිලධාරි | 003 |

- නිදර්ශන

1 වන මනාපය ලෙස ව්‍යාප්ති නිලධාරි තනතුරද, 2 වන මනාපය ලෙස තාක්ෂණ නිලධාරි තනතුරද, 3 වැනි මනාපය ලෙස ගොවිපල් කළමනාකරු තනතුර ද අයදුම් කිරීමට අපේක්ෂා කරන අයදුම්කරුවකු එම තනතුරුවලට අදාල සංකේත අංක අයදුම් පත්‍රයේ 02 වගුවෙහි සංකේත අංකය යන තීරුවේ පහත පරිදි දැක්විය යුතුය.

| *අනු. අංකය* | *මනාප ප්‍රමුඛතාවය* | *තනතුර* | *සංකේත අංකය* |
|---|---|---|---|
| 1 | 1 වන මනාපය | ව්‍යාප්ති නිලධාරි | 002 |
| 2 | 2 වන මනාපය | තාක්ෂණ නිලධාරී | 003 |
| 3 | 3 වන මනාපය | ගොවිපල් කළමනාකරු | 001 |

(*ඇ*) අයදුම්පත්‍ර පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

(ඈ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2018.01.08 දින හෝ ඊට ප්‍රථම "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව , ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ විභාගයේ නම පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ඉ) පහතින් දක්වා ඇති පරිදි අයදුම්කරන තනතුරු සංඛ්‍යාවට අනුව අදාළවන විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක 2003-02-13 යටතේ රජයේ අදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් / උපතැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබාගන්නා ලදුපත , එහි එක් දාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාග ගාස්තු වලට අමතරව කිසිදු අයකිරීමක් සිදු නොකරන බවද කාරුණිකව දන්වමි. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර නොගන්නා අතර විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ.

| *අයදුම්කරන තනතුරු සංඛ්‍යාව* | *විභාග ගාස්තුව* |
|---|---|
| ගොවිපල් කළමනාකරු හා/හෝ ව්‍යාප්ති නිලධාරි තනතුර සඳහා | රු. 600 |
| තාක්ෂණික නිලධාරි තනතුර සඳහා | රු. 600 |
| ගොවිපල් කළමනාකරු හා/හෝ ව්‍යාප්ති නිලධාරි තනතුර සහ තාක්ෂණික නිලධාරි තනතුර සඳහා | රු. 900 |

(ඊ) මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර, සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, තැපෑලේ දී සිදුවන නැතිවීම් හා ප්‍රමාද වීම් පිළිබඳව දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ. එබැවින්, අයදුම්පත්‍ර යොමු කිරීමට ප්‍රථම විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත්කොට අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර ඇතිද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තු ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට ඇතුළත්කොට ලදුපත් අලවා ඇත්ද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් වන ලෙස දන්වමි. තවද , සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(උ) අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවාද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියකු, රු. 2,40,360/- ක හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතුය.

(ඌ) දැනටමත් රජයේ සේවයේ නියුතුවූවන් තම ආයතන ප්‍රධානියා මගින් මෙම අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

- *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්* - අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බවට අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

07. *විභාග පරිපාටිය* :-

(අ) *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමා තුළවන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයෙකු විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේ දී ම තමාට නියමිත මධ්‍යස්ථානයේ දී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන කිසිදු අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ). මෙම විභාගය 2018 මාර්තු මස කොළඹ දී පමණක් පැවැත්වේ. විභාග දිනට දින 05 කට කලින් ප්‍රවේශ පත්‍ර නොලබන අපේක්ෂක / අපේක්ෂිකාවන් පහත සඳහන් විස්තර ඉදිරිපත් කරමින් නොපමාව බත්තරමුල්ල, පැලවත්ත, විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාව වෙතින් විමසිය යුතුය.

අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත්කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2 ක් හෝ 3 ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම්, එහි සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එහි දී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළ යුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, මුදල් ගෙවන ලද කුවිතාන්සියේ පිටපත හා අයදුම්පත්‍ර තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබාගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් හා ඉහත දැක්වෙන තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් මගින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින් විමසා සිටීම ද ප්‍රතිඵලදායී වනු ඇත.

පහත සඳහන් තොරතුරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. :-

(i) විභාගයේ නම,
(ii) අපේක්ෂක/ අපේක්ෂිකාවගේ සම්පූර්ණ නම,
(iii) ලිපිනය,
(iv) ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි කළ දිනය, ලියාපදිංචි කළ තැපැල් කාර්යාලය හා අංකය,
(v) විභාග ගාස්තු ගෙවූ කුවිතාන්සියේ අංකය, දිනය හා තැපැල් කාර්යාලය.

(ඇ) විභාගයට පෙනී සිටීම වෙනුවෙන් අපේක්ෂක/අපේක්ෂිකාවන්ට දුරිමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

(ඈ) අනන්‍යතාවය :- තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් විභාග ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. මේ සඳහා,

(i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත ; හෝ
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පිළිගැනේ.

තම අනන්‍යතාවය තහවුරු කිරීමට අදාළ ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

(ඉ) <u>විෂයය නිර්දේශය :-</u>

ගොවිපල් කළමනාකරු හා ව්‍යාප්ති නිලධාරී තනතුරු දෙකම සඳහා පැවැත්වෙනුයේ එක් ලිඛිත විභාගයක් පමණි.

| විෂයය අංකය | විෂයය | කාලය පැය | උපරිම ලකුණු | සමත් ලකුණු | අදළ වන තනතුර |
|---|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | 1 | 100 | 40% | සියලුම තනතුරු සඳහා |
| 02 | පොදු පරීක්ෂණය I<br>(තාක්ෂණ හා විෂයානුබද්ධ පොදු පරීක්ෂණය) | 3 | 100 | 40% | ගොවිපල් කළමනාකරු හා ව්‍යාප්ති නිලධාරී තනතුරු සඳහා |
| 03 | පොදු පරීක්ෂණය II<br>(තාක්ෂණ හා විෂයානුබද්ධ පොදු පරීක්ෂණය) | 3 | 100 | 40% | තාක්ෂණික නිලධාරී තනතුර සඳහා |

(i) බුද්ධි පරීක්ෂණය :- (සියලුම තනතුරු සඳහා අදළ වේ)
අපේක්ෂකයාගේ, තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව සිතීමේ හැකියාවත් තීරණ ගැනීමේ ශක්තියත් නිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(ii) **පොදු පරීක්ෂණය I (තාක්ෂණ හා විෂයානුබද්ධ පොදු පරීක්ෂණය) :- (ගොවිපල් කළමනාකරු හා ව්‍යාප්ති නිලධාරී තනතුරු සඳහා අදළ වේ)**

- සාමාන්‍ය කෘෂිකර්මය හා මූලධර්ම
- බෝග නිෂ්පාදනය හා මූලධර්ම ශෂ්‍ය විද්‍යාත්මක කරුණු
- පස හා පොහොර, ශාක පෝෂණය, පාරිසරික බලපෑම්
- බෝග ප්‍රචාරණ ක්‍රම
- රෝග හා පළිබෝධකාරකයන්, ලක්ෂණ හා හානි
- කෘෂිකාර්මික ප්‍රතිපත්ති, අතීත වර්තමාන හා අනාගත විභවයන්
- අපනයන කෘෂිකර්ම බෝග, ගම්මිරිස්, කුරුඳු, කෝපි, කොකෝවා, කරඳමුංගු, කරාබු, සාදික්කා, බුලත්, පුවක්, වැනිලා සහ අනෙකුත් බෝගවලට අදළ උද්භිත විද්‍යාත්මක කරුණු, දේශගුණික සාධක, පොහොර බලපෑම හා පෝෂණය, රෝග හා පළිබෝධ පසු අස්වනු තාක්ෂණය
- අපනයන බෝග අලෙවිය සහ අපනයන විභවයන්
- කාබනික ගොවිතැන
- ගොවිපල පාලනය, පැළ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය, තවාන් පාලනය හා කාබනික ගොවිතැන
- කෘෂිකර්ම ව්‍යාප්ති ක්‍රම හා ව්‍යාප්තිවේදය

(iii). **පොදු පරීක්ෂණය II (තාක්ෂණ හා විෂයානුබද්ධ පොදු පරීක්ෂණය) :- (තාක්ෂණික නිලධාරි තනතුර සඳහා අදාළ වේ)**

➢ කෘෂි කාර්මික මූලධර්ම
- ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප හා බෝග නිෂ්පාදනය කෙරෙහි ඒවායේ බලපෑම
- පස් වර්ග, පාංශු සංරක්ෂණය, ශාක පෝෂණය හා ජල සංරක්ෂණය
- පළිබෝධ හඳුනාගැනීම, වර්ගීකරණය හා මර්දනය
- ශාක ප්‍රචාරණය, තවාන් පාලනය හා පටක රෝපණය
- කෘෂිකර්මය හා පරිසරය
- වතු වගාව, ක්ෂේත්‍ර බෝග වගාව, මිශ්‍ර බෝග වගාව හා කෘෂි වන වගාව
- පසු අස්වනු තාක්ෂණය
- අපනයන කෘෂි බෝග අර්ථ දැක්වීම, ප්‍රචාරණය, ක්ෂේත්‍ර ස්ථාපනය, නඩත්තුව, රෝග පළිබෝධ පාලනය හා අස්වනු සැකසීම
- ගොවිපල පාලනය හා සැලසුම් කිරීම

➢ ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත සංවර්ධනය හා සම්බන්ධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන එකිනෙකෙහි දායකත්වය

➢ රසායනාගාර උපකරණ හඳුනා ගැනීම, ප්‍රයෝජනය හා පිරිසිදු කිරීම සහ රසායනික ද්‍රව්‍ය ආරක්ෂිතව පරිහරණය, ගබඩා කර තැබීම.

(ඊ). මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර, විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

**08. සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :**

(i). තෝරාගනු ලබන අපේක්ෂක/ අපේක්ෂිකාවන් දිවයිනේ කවර ප්‍රදේශයක දී වුව ද, සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

(ii). මෙම තනතුරට පත් කරනු ලබන්නන් අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වනු ඇත.

**09. බඳවා ගැනීමේ ක්‍රමය :**

ලිඛිත තරග විභාගය සඳහා නියමිත සෑම ප්‍රශ්න පත්‍රයකටම 40% ක් හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දීම සිදු නොකරන අතර, සුදුසුකම් තහවුරු කළ අයදුම්කරුවන් විභාග යේ දී ලබාගත් මුළු ලකුණුවල කුසලතා අනු පිළිවෙල මත බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. සියලුම බඳවා ගැනීම් නිම කිරීමෙන් අනතුරුව අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් අනෙකුත් අයදුම්කරුවන්ගේ ලකුණු නිකුත් කරන ලෙස දැන්වූ පසු විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත තමා විභාගයේ දී එක් එක් විෂයයට ලබාගත් ලකුණු හා මුළු ලකුණු ඇතුළත් ප්‍රතිඵල ලේඛනයක් පෞද්ගලිකව ලබාදීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ඇත.

**10.** තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම අයදුම්කරු විභාගයට ඉදිරිපත් වීමට හෝ මෙම තනතුරට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට්* නිවේදනය අනුව සුදුසුකම් පරීක්ෂා කරන අවස්ථාවේ දී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් පත්වීම් ලැබීමට නුසුදුස්සකු සේ සලකා ක්‍රියා කරනු ලැබේ.

11. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධයෙන් පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

12. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි, යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඇයට හෝ ඔහුට සිදුවනු ඇත.

13. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදිසේ සලකා කටයුතු කරනු ලැබේ.

ආචාර්ය ඒ. පී. හීන්කෙන්ද,
අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් (රා. ආ.)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

ආදර්ශ අයදුම්පත්‍රය

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ III ශ්‍රේණියේ ව්‍යාප්ති නිලධාරි, ගොවිපල් කළමනාකරු හා තාක්‍ෂණ නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017

**Application for the Competitive Examination for Recruitment to the Post of Extention Officer, Farm Manager and Technological Officer of Class III of the Sri Lanka Technological Service in the Department of Export Agriculture - 2017**

01. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : සිංහල - 2 (අදාළ අංකය කොටුව
දෙමළ - 3 තුළ ලියන්න)
ඉංග්‍රීසි - 4

02. අයදුම් කරන තනතුර/තනතුරු :
අයදුම් කරනු ලබන තනතුර හෝ තනතුරු ප්‍රමුඛතාවය අනුව සටහන් කළ යුතුය. එක් තනතුරක් සඳහා පමණක් අයදුම් කළ ද, එම තනතුර සටහන් කළ යුතු ය.

| අනු. අංකය | මනාප ප්‍රමුඛතාවය | තනතුර | සංකේත අංකය |
|---|---|---|---|
| 1 | 1 වන මනාපය | | |
| 2 | 2 වන මනාපය | | |
| 3 | 3 වන මනාපය | | |

03. නම :-
3.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
3.2 අගට යෙදෙන නම මුලින් ද, අනෙකුත් නම්වල මුලකුරු පසුව ද, යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : GUNAWARDHANA H. M. S. K. )
3.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

04. ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
4.1 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
4.2 දුරකථන අංකය (ඇත්නම්)

ජංගම : | | | | | | | | | | |

ස්ථාවර : | | | | | | | | | | |

05. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | |

06. ස්ත්‍රී/පුරුෂ භාවය :

ස්ත්‍රී 1 පුරුෂ 0 [ ]

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

07. විවාහක/අවිවාහක බව
විවාහක - 2 අවිවාහක -1 [ ]

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

08. 8.1 උපන් දිනය :

වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

8.2 ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස : (2018.01.08)

අවු. : | | | මාස : | | | දින : | | |

09. *අධ්‍යාපන සුදුසුකම්* :
(අ) අ.පො.ස. (සා. පෙළ)
වර්ෂය හා මාසය :————.
විභාග අංකය :————.
භාෂා මාධ්‍යය :————.

| | විෂයය | සාමාර්ථය | | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 1. | | | 6. | | |
| 2. | | | 7. | | |
| 3. | | | 8. | | |
| 4. | | | 9. | | |
| 5. | | | 10. | | |

(*ආ*) අ.පො.ස. (උ. පෙළ) :
වර්ෂය හා මාසය :————.
විභාග අංකය :————.
භාෂා මාධ්‍යය :————.

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 1. | | |
| 2 | | |
| 3. | | |
| 4. | | |

(*ඇ*) *වෘත්තීය සුදුසුකම්* :-

| ඩිප්ලෝමාව සහ ආයතනයේ නම | සමත් වූ වර්ෂය | විභාග අංකය |
|---|---|---|
| | | |

| | |
|---|---|
| විභාග ගාස්තු ගෙවනු ලැබූ කුවිතාන්සියේ අංකය | |
| දිනය | |
| මුදල් ගෙවූ තැපැල්/උප තැපැල් කාර්යාලය | |

10. | ගෙවන ලද මුදල | |

විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ එක් දරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.

(කුවිතාන්සියේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

11. අයදුම්කරුගේ සහතිකය ෑ

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා බවට මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි ඒවා බව හෝ මා තෝරා ගැනීමට පෙර දැනගතහොත්, මා නුසුදුස්සකු වීමට යටත් වන බවත්, පත් කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දැන සිටිමි.

තව ද මෙම විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ෑ

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ...................... යන අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී. ........... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

————,
අත්සන සහිතක කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

13. අයදුම්කරු රජයේ සේවයේ නියුක්තවූවෙක් නම් ආයතන ප්‍රධානියාගේ සහතිකය ෑ

ඉහත තොරතුරු සඳහන්.................. මයා/මිය/මෙනවිය .......................... අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ කාර්යාලයේ සේවය කරන බවද ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බව ද නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බව ද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බව ද, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බව ද සහතික කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාව)

12-292

---

**සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාවන් සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2017

1. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ පහත සඳහන් අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාවන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් උපාධිය ලබා ඇති සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.
2. තනතුරට අදාළ අධ්‍යාපන හා වෙනත් විශේෂ සුදුසුකම් :-

| සංකේත අංකය | අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව | සම්පූර්ණ කළ යුතු උපාධිය |
|---|---|---|
| 1 | වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | වෛද්‍ය රසායනාගාරවේදී (B.Sc.MLS) |
| 2 | ඖෂධවේදී | ඖෂධවේදී (B.Phram)<br>විද්‍යාවේදී (ඖෂධවේදී) (B.Sc.(Pharmacy) |
| 3 | භෞති චිකිත්සක | භෞත චිකිත්සකවේදී (B.Sc.Physiotherapy) |
| 4 | විකිරණ ශිල්පී | විකිරණ ප්‍රතිකාරවේදී (B.Sc Radiotheraphy)<br>විකිරණ විද්‍යාවේදී (B.Sc.Radiography) |

3. අනෙකුත් පොදු සුදුසුකම් :
   (*අ*) 2018.01.08 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු, වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.
   (*ආ*) අදල උපාධිය බලපැවැත්වෙන දිනය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර දිනයක් විය යුතු ය.
   (*ඇ*) මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් සමන්විය යුතු ය.

4. අයදුම් කළ යුතු ක්‍රමය :

   (අ) A4 ප්‍රමාණයේ කඩදසි භාවිතා කර මේ සමග ඇති ආකෘති පත්‍රයට අනුව (අංක 1 සිට 09 දක්වා පළමු පිටුවේ ද, 10 සිට 13 දක්වා දෙවන පිටුවේද වන සේ) අයදුම්පත සකස් කරගත යුතු ය.

   (ආ) අයදුම්පතේ "ලදුපත" ස්ථානයේ, ලංකා බැංකුව, තැප්‍රොබ්න් ශාඛාවේ අංක 7041318 දරන "සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විභාග ගාස්තු රැස් කිරීම" යන ගිණුමට රු. 300.00 බැරකර එම ලදුපත නොගැලවෙන සේ ඇලවිය යුතු ය. (ලදුපත ඇලවීමට පෙර එහි පිටපතක් තබා ගන්න)

   (ඇ) අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු හෝ සාමදන විනිශ්චයකාරවරයකු හෝ දිවුරුම් කොමසාරිස්වරයකු හෝ නීතිඥවරයකු හෙ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ ත්‍රිවිධ හමුදවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ ගැසට් කරන ලද තනතුරක් දරන නිළධාරියකු හෝ රු. 393,684 ට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිළධාරියෙකු හෝ විසින් සහතික කළ යුතු ය.

   (ඈ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 9X4 ප්‍රමාණයේ ලියුම් කවරයක බහා එම කවරයේ ඉහළ කෙළවරේ "පරිපූරක වෛද්‍ය සේවාවන්හි පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් ලෙස උපාධිධාරීන් බඳවා ගැනීම - 2017" වශයෙන් හා අදළ උපාධිය හා අධ්‍යයන වර්ෂයද සඳහන් කර 2018.01.08 දිනට පෙර අධ්‍යක්ෂ (පාලන) 02, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යංශය, සුවසිරිපාය, 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

5. රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතු ය. එමෙන්ම මෙය බාහිර බඳවා ගැනීමක් බවත් අදල පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමට හැකි හෝ නොහැකි වුවහොත් කිසිඳු අයුරකින් දනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත් සිහි තබාගත යුතු ය.

6. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මෙම නිවේදනයේ දක්වෙන නියමයන්ට හා අදල ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. එක් එක් පුහුණු පාඨමාලාවන්ට අදලව ඉහතින් දක්වා ඇති උපාධිධාරීන්ගේ උපාධිය බලපවත්වන දිනය (Effective Date) හා උපාධියේ ශ්‍රේණියේ සාමාන්‍ය අගය (GPA) පදනම් කරගෙන කුසලතා ලේඛණ සකස් කර එක් එක් පුහුණු පාඨමාලාවන්ට සුදුස්සන් තෝරාගනු ලැබේ. මෙම උපාධිධාරීන් බඳවා ගැනීමට අදලව මීට පෙර නිකුත් කර ඇති *ගැසට් නිවේදනයේ* අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසන් දිනය වූ 2016.06.25 දිනට පසුව උපාධිය ලබා ඇති අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

8. පුරප්පාඩු සංඛ්‍යාවට වඩා උපාධිධාරීන් අයදුම් කර තිබේනම් අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාවට බඳවා ගැනීම සඳහා සාමාන්‍ය දනීම හා අභියෝග්‍යතාවය පිළිබඳ පැය 01ක ප්‍රශ්න පත්‍රයකින් යුත් ලිඛිත විභාගයක් පවත්වා එම විභාගයේ දී දක්වන කුසලතාවය අනුව වෙන් කල හැකි පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් පුහුණුවට බඳවා ගැනීම සිදුකෙරේ. සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන්/ අයදුම්කාරියන් විසින් පහත සඳහන් ලියවිලිවල මුල් පිටපත් හා එහි සහතික කරන ලද පිටපත බැගින් ඉදිරිපත් කළ යුතු ය.

   (අ) උප්පැන්න සහතිකය
   (ආ) උපාධි සහතිකයේ මුල් පිටපත (මෙහි සහතික කළ පිටපතක් අයදුම්පත සමගද අමුණා එවිය යුතු ය.)
   (ඇ) අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල දක්වෙන සහතිකයේ මුල් පිටපත
   (ඈ) ජාතික හැදුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය.
   (ඉ) පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචිය පිළබඳ සහතික (ග්‍රාම නිළධාරී සහතිකය).

9. පුහුණු කිරීමේ පරිපාටිය :-

| සංකේත අංකය | අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව | එම පාඨමාලාවේ කාල සීමාව | එම පාඨමාලාවේ හැදෑරිය යුතු භාෂා මාධ්‍යය |
|---|---|---|---|
| 1 | වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | මාස 06 | ඉංග්‍රීසි |
| 2 | ඖෂධවේදී | මාස 06 | ඉංග්‍රීසි |
| 3 | භෞත චිකිත්සක | මාස 06 | ඉංග්‍රීසි |
| 4 | විකිරණ ශිල්පී | මාස 06 | ඉංග්‍රීසි |

I. සම්මුඛ පරීක්ෂණයට ලක් කරන ලද අයදුම්කරුවන් අතරින් තෝරාගත් අයදුම්කරුවන්/ අයදුම්කාරියන් අදාළ අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව හැදෑරීම සඳහා පුහුණු පාසල්වලට අනුයුක්ත කරනු ලැබේ. පාඨාමාලාවන් ඉදිරියේ දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් හැදෑරිය යුතු ය.

II. පුහුණු පාසල්වල ඇතුලත් කරන අභ්‍යාසලාභීන් පුහුණු පාසල්වල බල පැවැත්වෙන නීති රීතිවලට හා සෞඛ්‍ය. පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් කළින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත.

III. පුහුණුව ලබන කාලපරිච්ඡේදය අවසානයේ දී පුහුණුව සාර්ථකව නිම නොකරන හෝ වැඩ හා හැසිරීම සතුටුදයක නොවන හෝ තමන් ඇතුලත් කරනු ලබන පුහුණු පාසලෙහි පවතින කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව, ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැකි ය.

IV. පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ දී අභ්‍යාසලාභීන්ට 03/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන අනුව දීමනා ගෙවනු ලැබේ.

V. පුහුණු පාසලට ඇතුලත් කරනු ලබන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණයෙන්ම නිම කිරීමෙන් පසු අදාළ තනතුරේ පත්වීම් ලදහොත් අවම වශයෙන් වර්ෂ පහක (05) කාලපරිච්ඡේදයක් අදාළ තනතුරේ සේවය කරන බවටත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමග ගිවිසුමකට හා ඇපකරයකට එළඹිය යුතු ය. පුහුණු කාලසීමාව තුළ දී පුහුණුවෙන් ඉවත් වුවහොත් හෝ පුහුණුව හැරගියහොත් හෝ ඉහත III වගන්තිය අනුව පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත් හෝ පත්වීම් ලැබ වර්ෂ (05) කාලපරිච්ඡේදයක් අදාළ තනතුරේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් හෝ පුහුණු කාලය තුළ දී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන වියහියදම් ගිවිසුමට හා ඇපකරයට අදාළ මුදල ඔහු/ඇය විසින් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙත ගෙවිය යුතු ය. එසේ නොමැති වුවහොත් එම මුදල් අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

10. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන්* :

පුහුණුව අවසානයේ අදාළ තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීම සිදුකරන/ නොකරන බව තීරණය කරනු ලබන්නේ එම අවස්ථාවේ පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පදනම්ව ය. ඒ අනුව අදාළ තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය තීරණය කළහොත් අපේක්ෂක/ අපේක්ෂිකාවන් තමන් පුහුණුවට බඳවාගත් පාඨමාලාවට අදාළ බඳවා ගැනීමේ පටිපාටියේ කොන්දේසි හා පුරප්පාඩු මත අදාළ තනතුරේ III වන පංතියේ තනතුරට පත්කිරීමට කටයුතු කෙරේ. උක්ත සංකේත අංක 1,2,3,4 ලෙසින් වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ තනතුරු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව MT-6-2016 හි පරිදි රු. 32,080 - 445x10 - 660x11 - 730x10 - 750x10 - රු. 58,590 යන වැටුප් පරිමාණය හිමිවන අතර ගෙවීම් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි විධිවිධාන අනුව සිදු කරනු ලැබේ.

11. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුලත් කළ යුතු ය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම ලැබීමෙන් පසු ඉහත සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/ තනතුරින් පහකර ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නාවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුලත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. තව ද පුහුණු කාලය තුළදී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද වියහියදම්හි ගිවිසුමට හා ඇපකරයට අදාළ මුදල ඔහුගෙන්/ඇයගෙන් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

12. තෝරාගත් අයදුම්කරුවන් අදාළ පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවීමේ පළමු මාසය ඇතුලත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

13. ඉහත පරිදි බඳවා ගන්නා ලද සියළුම දෙනා රජයේ නිලධාරීන්ට අදළ වන සියළුම නිතීරිතී, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට මුදල් රෙගුලාසි හා වෙනත් රෙගුලාසිවලට ද රජය විසින් වරින්වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ට ද යටත් වනු ඇත.

14. පුහුණුවට බඳවා ගනු ලබන අයදුම්කරුවන් සඳහා පුහුණු පාසල්වල නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටී. ලබා දෙන්නේනම් ඒ සඳහා තක්සේරු නිවාස කාමර කුලීය, ජල හා විදුලි බිල්පත් අයකරනු ලැබේ.

15. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම *ගැසට්* නිවේදනය මගින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටළු සහගත තත්ත්වයක් උද වුවහොත් ඒ පිළිබඳව සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

ජනක සුගතදස,
ලේකම්,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2017 නොවැම්බර් මස 22 වැනි දින,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

**ආදර්ශ අයදුම්පත**

***වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ පාඨමාලාවන් සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2017***

| පුහුණු පාඨමාලාවන්ට අදළ සංකේත අංකය (*ගැසට්* නිවේදනයට අනුව) |
|---|
| |

(අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර *ගැසට්* නිවේදනය හොඳින් කියවා බලන්න)

- අයදුම් කරන පාඨමාලාව (සිංහලෙන්/දෙමළෙන්) :————.
- අයදුම් කරන පාඨමාලාව (ඉංග්‍රීසියෙන්) :————.

1. (*අ*) මුලකුරු සමග අගට යෙදෙන නම :————.
   (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) - උද. A.B.C. SILVA
   (*ආ*) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
   (*ඇ*) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | (පිටපතක් අමුණන්න)

3. තැපැල් ලිපිනය : සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියෙන්

| සිංහලෙන්/දෙමළෙන් | ඉංග්‍රීසියෙන් |
|---|---|
| ........................... | ........................... |
| ........................... | ........................... |
| ........................... | ........................... |
| ........................... | ........................... |

4. (අ) ස්ථිර ලිපිනය : සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියෙන්

........................... ...........................
........................... ...........................
........................... ...........................
........................... ...........................

(ආ) දුරකථන අංක :- ජංගම ☐☐☐☐☐☐☐☐☐☐ ස්ථිර ☐☐☐☐☐☐☐☐☐☐

(ඇ) පදිංචි දිස්ත්‍රික්කය :- සිංහලෙන්/දෙමළෙන් :————. ඉංග්‍රීසියෙන් :————.

(ඇ) ඔබ මෙම දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවෙක්ද? ඔව්/ නැත :————.

(ඉ) ඔව් නම් කොපමණ කලක පටන්ද ? :————.

5. උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :————.
2018.01.08 දිනට වයස අවුරුදු :————. මාස :————. දින :————.

6. ස්ත්‍රී/පුරුෂ භාවය :- ස්ත්‍රී - ☐ පුරුෂ - ☐ (අදල කොටුවේ ✓ ලකුණ යොදන්න)

7. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද වන වග :- ඔව් -☐ නැත - ☐ (අදල කොටුවේ ✓ ලකුණ යොදන්න)

8. විවාහක/අවිවාහක බව :- විවාහක - ☐ අවිවාහක - ☐

9. අධ්‍යාපන සුදුසුකම් :-

| අනු. අංකය | සමත් වූ උපාධිය | සාමාර්ථය | ශ්‍රේණියේ සාමාන්‍ය අගය (GPA) හා උපාධිය බලපවත්වන දිනය | විශ්ව විද්‍යාලය | අධ්‍යයන වර්ෂය |
|---|---|---|---|---|---|
| | | | | | |

10. ඔබ කවරදක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේ ද? ඔව් - ☐ නැත - ☐
(අදල කොටුවේ ✓ ලකුණ යොදන්න)

ඔව් නම් විස්තර සපයන්න :————.

11. අයදුම්කරුගේ සහතිකය :-

(අ) මා විසින් *ගැසට්* නිවේදනය හොඳින් කියවා බලා අවබෝධ කරගෙන එහි සඳහන් සියළු කොන්දේසිවලට යටත්ව මෙම අයදුම්පත සම්පූර්ණ කළ බවත්, මම වෙනත් පූර්ණකාලීන පාඨමාලාවට සහභාගී නොවන බවත්, මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය හෝ අයදුම්පතෙහි සඳහන් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මා පුහුණුවට නුසුදුස්සකු වන බව හා පත්වීම් ලදහොත් ඉන් අනතුරුව හෝ එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට මා යටත් බව ද මම දන සිටිමි.

(ඇ) එමෙන්ම මෙම බඳවා ගැනීම බාහිර බඳවා ගැනීමක් බවත්, මට අදල පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමට හැකි හෝ නොහැකි වුවහොත් කිසිඳු අයුරකින් දූනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත් හොඳින් අවබෝධ කරගෙන සිටින බවත් ප්‍රකාශ කර සිටිමි.

| |
|---|
| ලංකා බැංකු තැප්‍රොබේන් ශාඛාවේ, අංක 7041318 දරන ශාඛාවේ, සෞ.සේ.අ.ජ. විභාග ගාස්තු රැස්කිරීම යන ගිණුමට අදල මුදල් ගෙවා එම ලදුපතෙහි මුල් පිටපත මෙම ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. |

දිනය :————.

————,
අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ අත්සන.

12. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :
මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..................................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකවම දන්නා හඳුනන බව ද, ඔහු/ඇය .................................... දින මා ඉදිරිපිට දී ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

දිනය :————.

————,
සහතික කරන්නාගේ අත්සන.

* සහතික කරන නිළධාරියාගේ සම්පූර්ණ නම :————.
* තනතුර :————.
* ලිපිනය :————.

- සහතික කරන්නාගේ නිල මුද්‍රාව -

13. ඉල්ලුම් කරන අපේක්ෂකයා රාජ්‍ය සේවාවේ/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙක් නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අදල නොවන වචන කපා හරින්න)

i. ඉහත අයදුම්කරු/අයදුම්කාරිය වන .......................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ .................................................. තනතුර දරන බව මින් සහතික කරමි.
ii. ඉල්ලුම් පත්‍රයේ සඳහන් තොරතුරු සත්‍ය තොරතුරු බව සහතික කරන අතර, මොහු/මැය තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය දරන තනතුරට නිදහස් කළ හැකි/නොහැකි බව දන්වමි.
iii. එමෙන්ම මෙම බඳවා ගැනීම බාහිර බඳවා ගැනීමක් බවත්, ඔහු/ඇය අදල පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් හෝ නොකිරීමෙන් පසු කිසිඳු අයුරකින් දූනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත් ඔහුට/ඇයට අවබෝධ කරදුන් බවත් දන්වා සිටිමි.

දිනය :————.

————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

* දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම :————.

* තනතුර :————.

- දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිල මුද්‍රාව -

* ලිපිනය :————.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2017** | | | |
| **දෙසැම්බර්** | 2017.12.08 | සිකුරාදා | 2017.11.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.12.15 | සිකුරාදා | 2017.11.30 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2017.12.22 | සිකුරාදා | 2017.12.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.12.29 | සිකුරාදා | 2017.12.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2018** | | | |
| **ජනවාරි** | 2018.01.05 | සිකුරාදා | 2017.12.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.01.12 | සිකුරාදා | 2017.12.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.01.19 | සිකුරාදා | 2018.01.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.01.26 | සිකුරාදා | 2018.01.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2018.02.02 | සිකුරාදා | 2018.01.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.02.09 | සිකුරාදා | 2018.01.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.02.16 | සිකුරාදා | 2018.02.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.02.23 | සිකුරාදා | 2018.02.09 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ. බ.*).

2017 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.